ශ්‍රී ලංකා නීතිඥ සංගමය

இலங்கை சட்டத்தரணிகள் சங்கம்

BAR ASSOCIATION OF SRI LANKA

සිංහල පරිවර්තනය

2026 අගෝස්තු 12 වැනිදා

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යෝජිත 22 වැනි සංශෝධනය සම්බන්ධයෙන් - ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නිවේදනය**

2026 අගෝස්තු 7 වැනිදා රජය විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 22 වැනි සංශෝධනයට අදාළ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මතුව ඇති බරපතළ ගැටලු පිළිබඳව ශ්‍රී ලංකා නීතිඥ සංගමය (BASL) විසින් රජයේ සහ ශ්‍රී ලංකා ජනරජයේ ජනතාවගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමු.

මෙම පනත් කෙටුම්පතේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ ගරු විනිසුරුවරුන්ගේ විශ්‍රාම ගැනීමේ වයස් සීමාව දීර්ඝ කිරීමයි.

යෝජිත සංශෝධනය මගින් නඩු විභාග කඩිනම් කර අධිකරණ පද්ධතියේ කාර්යක්ෂමතාව වැඩි කිරීම අරමුණු කරන බව රජය ප්‍රකාශ කර ඇතත්, ගරු විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීම සහ එම ප්‍රකාශිත අරමුණු අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි නොවේ.

ශ්‍රී ලංකා නීතිඥ සංගමය සහ අධිකරණ සේවා සංගමය ඇතුළු නීති ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් මෙම සංශෝධනයට ඒකමතිකව විරෝධය පළ කර ඇත්තේ එය අධිකරණයේ ස්වාධීනත්වයට සෘජු මැදිහත්වීමක් වන බැවිනි. ආගමික නායකයන්, පුළුල් පරාසයක සිවිල් සමාජ සංවිධාන මෙන්ම විදේශයන්හි ප්‍රමුඛ නීතිඥ සංගම් සහ විනිසුරු සංගම් ද මෙම විරෝධතාවයට එක්වී ඇත.

එහෙයින් යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් තම දැඩි විරෝධය ශ්‍රී ලංකා නීතිඥ සංගමය නැවත අවධාරණය කරයි. මෙම විරෝධතා සහ වර්ධනය වෙමින් පවතින මහජන විවේචන නොසලකා හරිමින් රජය මෙම යෝජනාව ඉදිරියට ගෙන යාමට කටයුතු කරන්නේ නම්, එවැනි සංශෝධනයක් නීත්‍යානුකූලව සම්මත කරගත හැක්කේ ජනතාවගේ ජනමත විචාරණයක අනුමැතිය ලබා ගැනීමෙන් පමණක් බව ශ්‍රී ලංකා නීතිඥ සංගමය අවධාරණය කරයි.



President Rajeev Amarasuriya | Deputy President Rienzie Arsecularatne PC | Secretary Nalin De Silva | Treasurer Pasindu Silva | Assistant Secretary Lakitha Wakishta Arachchi

No. 153, Mihindu Mawatha, Colombo 12, Sri Lanka.
Telephone : +94 11 2447134, +94 11 2331697, Fax : +94 11 2331697 E-mail : info@basl.lk Web : www.basl.lk

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වැනි ව්‍යවස්ථාව මඟින් උසස් අධිකරණවල විනිසුරුවරුන්ගේ විශ්‍රාම යන වයස නියම කර ඇති අතර, එය XV වන පරිච්ඡේදයේ "අධිකරණයේ ස්වාධීනත්වය" යන ශීර්ෂය යටතේ ව්‍යවස්ථාගත කර ඇති බව ශ්‍රී ලංකා නීතිඥ සංගමය අවධාරණය කරයි. එම ව්‍යවස්ථාගත කිරීම මඟින් එයට සිදු කරන ඕනෑම සංශෝධනයක් අධිකරණයේ ස්වාධීනත්වයට සෘජුවම බලපාන බව පැහැදිලි වේ. තවද, 4(ඇ) ව්‍යවස්ථාව යටතේ අධිකරණ බලය ජනතාවගේ පරමාධිපත්‍යයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස පිළිගෙන ඇති අතර, 3 වැනි ව්‍යවස්ථාව මඟින් පරමාධිපත්‍යය ජනතාව වෙත පැවරී ඇති බවත් එය අන්සතු කළ නොහැකි බවත් තහවුරු කරයි.

2022 වසරේදී ලබා දුන් SC SD 64–71/2022 නඩුවේ විශේෂ තීරණයේදී, ශ්‍රේෂ්ඨාධිකරණයේ ගරු විනිසුරුවරුන් විසින් මෙසේ නිරීක්ෂණය කර ඇත:

*"දැනට සේවයේ නිරත විනිසුරුවරුන්ට සෘජුව හෝ වක්‍රව බලපාන පරිදි විශ්‍රාම යන වයස හෝ ධුර කාලය සම්බන්ධයෙන් සිදු කරන ඕනෑම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් අධිකරණයේ ස්වාධීනත්වයට බලපාන අතර, ජනමත විචාරණයක් අවශ්‍ය බව නියම කරන 3 වැනි ව්‍යවස්ථාව උල්ලංඝනය කරනු ඇත."*

මෙම තීරණය මඟින් යෝජිත සංශෝධනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විශේෂයෙන් ආරක්ෂා කර ඇති (entrenched) විධිවිධානයක් වන අතර, ජනතාවගේ ජනමත විචාරණයක අනුමැතියකින් තොරව එය නීත්‍යානුකූලව පනවා ගත නොහැකි බව පැහැදිලි වේ.

කෙසේ වෙතත්, මෙම යෝජනාව පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනු ලැබුවහොත්, ඕනෑම පුරවැසියෙකුට එහි ව්‍යවස්ථානුකූලභාවය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝග කිරීමට අයිතිය සහ හිමිකම ඇත. එවැනි අභියෝගයක් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගරු විනිසුරුවරුන් අතිශය සංකීර්ණතාවයකට සහ ව්‍යවස්ථානුකූලව සංවේදී තත්ත්වයකට පත් කරනු ඇත. මන්ද, එම සංශෝධනය මඟින් තමන්ගේම ධුර කාලය දීර්ඝ කිරීමක් ලබා දෙන පසුබිමක, එම සංශෝධනයේ නීත්‍යානුකූලභාවය තීරණය කිරීමට ඔවුන්ට සිදුවන බැවිනි. මෙවැනි තත්ත්වයක් මඟින් අධිකරණය කෙරෙහි මහජන විශ්වාසය හීන වීමට ඉඩ ඇති අතර, එමඟින් එහි විශ්වසනීයත්වයට බරපතළ හානියක් සිදුවී, ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ මූලික කුළුණක් වන අධිකරණය කෙරෙහි ජනතාවගේ විශ්වාසය බිඳ වැටීමට ඉඩ ඇත.



President
Rajeev Amarasuriya

Deputy President
Rienzie Arsecularatne PC

Secretary
Nalin De Silva

Treasurer
Pasindu Silva

Assistant Secretary
Lakitha Wakishta Arachchi

No. 153, Mihindu Mawatha, Colombo 12, Sri Lanka.
Telephone : +94 11 2447134, +94 11 2331697, Fax : +94 11 2331697 E-mail : info@basl.lk Web : www.basl.lk

මෙම සංශෝධනය ඉදිරියට ගෙන නොයා යුතු බවට ඉදිරිපත් කර ඇති සියලු විරෝධතා සහ කරුණු නොතකා රජය තවදුරටත් එය ඉදිරියට ගෙන යාමට තීරණය කරන්නේ නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සහ ඉහත සඳහන් කළ සුවිශේෂී සංවේදී කරුණු සැලකිල්ලට ගනිමින්, එම පනත් කෙටුම්පත ජනමත විචාරණයකදී ජනතාව විසින් තීරණය කරනු පිණිස කැබිනට් මණ්ඩලය විසින් සෘජුවම ජනතාව වෙත ඉදිරිපත් කළ යුතු බව ශ්‍රී ලංකා නීතිඥ සංගමය අවධාරණය කරයි. එමඟින් මෙම කරුණ සම්බන්ධයෙන් තීරණයක් ලබා දීමට ශ්‍රේෂ්ඨාධිකරණයට සිදුවන තත්ත්වයෙන් එය ආරක්ෂා කර ගත හැකිය.

මෙම සංශෝධනය පනවා ගැනීම සඳහා ජනමත විචාරණයක් අත්‍යවශ්‍ය වන බව ද පැහැදිලිය. අධිකරණයේ ස්වාධීනත්වය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ලබා දී ඇති විශේෂ ආරක්ෂාව හේතුවෙන්, උසස් අධිකරණවල විනිසුරුවරුන්ගේ විශ්‍රාම යන වයස වෙනස් කිරීමක් සඳහා ජනතාවගේ පරමාධිපත්‍යය සහ ජනතාව සතු අධිකරණ බලයේ අවසාන භාරකරුවන් වන ජනතාව විසින්ම සෘජුවම අනුමැතිය ලබා දිය යුතුය.

තවද, වෙනත් රටවල මෙවැනි ස්වභාවයේ සංශෝධන සිදු කිරීමට පෙර විනිවිදභාවයෙන් යුත්, සියලු පාර්ශ්ව ඇතුළත් කරගත් සහ දීර්ඝ උපදේශන ක්‍රියාවලීන් සිදු කර තිබුණද, ශ්‍රී ලංකාවේදී ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ කිසිදු උපදේශනයක් සිදු කර නොමැති වීම පිළිබඳව ශ්‍රී ලංකා නීතිඥ සංගමය දැඩි කනස්සල්ල පළ කරයි.

අර්ථවත් උපදේශන ක්‍රියාවලියක් නොමැති වීමත්, මෙම යෝජනාව අසාමාන්‍ය ලෙස කඩිනමින් ඉදිරියට ගෙන යාමත් මහජන විශ්වාසය බරපතළ ලෙස හීන කරන අතර, අනාගත රජයන් විසින් අධිකරණයේ ක්‍රියාකාරීත්වය සහ ස්වාධීනත්වය තම අභිමතය පරිදි හැසිරවීමට උත්සාහ කළ හැකි භයානක පූර්වාදර්ශයක් ද ස්ථාපිත කරයි.

අත්සන් කළේ

**රජීව් අමරසූරිය**
**සභාපති**
**ශ්‍රී ලංකා නීතිඥ සංගමය**

**නලින් ද සිල්වා**
**ලේකම්**
**ශ්‍රී ලංකා නීතිඥ සංගමය**




President
**Rajeev Amarasuriya**

Deputy President
**Rienzie Arsecularatne PC**

Secretary
**Nalin De Silva**

Treasurer
**Pasindu Silva**

Assistant Secretary
**Lakitha Wakishta Arachchi**

No. 153, Mihindu Mawatha, Colombo 12, Sri Lanka.
Telephone : +94 11 2447134, +94 11 2331697, Fax : +94 11 2331697 E-mail : info@basl.lk Web : www.basl.lk